# වාරිමාර්ග අමාත්‍යාංශය

# පුරප්පාඩු

## මහවැලි ජල සුරක්ෂිතා ආයෝජන වැඩසටහන (MWSIP)

### අරමුදල් ප්‍රභවය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) යනු 2024 වර්ෂය වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිත ශ්‍රී ලංකා රජය හා ආසියානු සංවර්ධන බැංකුව (ADB) මගින් සහනදායී ණය පහසුකම් යටතේ අරමුදල් සැපයෙන හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහවැලි බහුකාර්ය සංවර්ධන වැඩසටහනේ ප්‍රධානත සැලැස්මේ එක් කොටසකි.

**අයදුම්පත් :**

පහත දක්වෙන තනතුරු සඳහා යෝග්‍ය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලබන අතර, අයදුම්කරුවන් විසින්, සිය ජීවදත්ත තොරතුරු ප්‍රකාශය (CV) සමග සිය අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයද සිය අධ්‍යාපනික වෘත්තීයවේදී සුදුසුකම් සහිත මූලික සුදුසුකම් හා ලබා ඇති පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර වල පිටපත් සමග පහත දක්වෙන ලිපිනයට 2021.12.14 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වන අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුරු ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය. එයට අතිරේක අයදුම්කරුවන් විසින් එම අයදුම්පතම එයට ඉදිරි පිටපතක් ලෙස pdadbprojects@gmail.com වෙතට යොමු කළ යුතු වන අතර. එය hr.mwsip@gmail.com වෙත පිටපත් කරමින් එම ඊමේල් ලිපිනයේ විෂය රේඛාව ලෙස අයදුම් කරනු ලබන තනතුරු සටහන් කර එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන,**
**අංක 493-1/1, T.B. ජයා මාවත,**
**කොළඹ 10.**

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, තෝරා ගැනීම් කුසලතා පදනම මත සිදු කරනු ලැබේ. එසේ හෙයින් බඳවා ගැනීමේ ක්‍රියාවලියට කිසියම් පෙළඹවීමක් කිරීම හෝ නියෝජනයන් සිදුකිරීම මගින් බලපෑම් කිරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු පාදක වනු ඇත. රජයේ සේවයේ/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ සමුපකාර සහ වෙනත් රාජ්‍ය ආයතනවල දැනටමත් සේවයේ නියුතු අපේක්ෂකයින්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන අතර, එම ප්‍රධානීන් විසින් මෙම අයදුම්කරුවන් මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් පූර්ණ කාලීනව මුදා, හැරිය හැකිද යන වග සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් එනම් ඉහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| තනතුර හා රැකියා පැතිකඩ | සුදුසුකම් හා පළපුරුද්ද |
| --- | --- |
| **ප්‍රසම්පාදන විශේෂඥ (PS-3)**<br><br>**වැඩසටහන් කළමනාකරණ ඒකකය - කොළඹ තනතුරු - 01**<br><br>**රැකියා පැතිකඩ**<br><br>පහත දැක්වෙන ද ඇතුළත්, ණය/ ප්‍රතිපාදන ගිවිසුමෙහි සහ හෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මෙහි විස්තර කොට දක්වා ඇති පරිදි ව්‍යාපෘති සකස් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ සියලු ආකාරයේ කාර්යයන් අතරතුර ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණ අවකාශය තුළ අදාළ තාක්ෂණික ආදානයන් සැපයීම.<br><br>❖ වැඩසටහන්/ ව්‍යාපෘතියට අවශ්‍ය පරිදි ප්‍රසම්පාදන සේවා<br>❖ ප්‍රසම්පාදනයෙහි සහ කොන්ත්‍රාත් කළමනාකරණයෙහි ව්‍යාපෘති ක්‍රියාකාරකම් හැසිරවීම<br>❖ වාරිමාර්ග / ජලසම්පත් ව්‍යාපෘති, වාහන යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආදිය කෙරෙහි අදාළ වන ප්‍රමිතීන් හා පිරිවිතරයන් සකස් කිරීම.<br>❖ ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කිරීමේ ගැටලු විශ්ලේෂණය කොට විසඳලීම.<br>❖ කොන්ත්‍රාත් කළමනාකරණයෙහි අර්බුද විසඳීම සහ සමථ කිරීමේ කටයුතු<br>❖ අනෙකුත් කණ්ඩායම් සාමාජිකයින් ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් කළමනාකරණ කටයුතු පිළිබඳව සම්බන්ධීකරණය හා විමසීම.<br>❖ වැඩසටහන් අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් අදාළ කාර්යයන්. | **පහත සඳහන් සුදුසුකම්, පළපුරුද්ද හා වැටුප් පරිමාණයන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2019 චක්‍රලේඛයට අනුකූලව වනු ඇත.**<br><br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>හෝ<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>හෝ<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත්, ආශ්‍රිත සමාජිකත්වයක් සමග වෘත්තීයවේදී සුදුසුකමක්<br>සමග<br>කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 14 ක පශ්චාත් යෝග්‍යතා / සුදුසුකම් පළපුරුද්ද.<br><br>2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.<br>හෝ<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගනු ලබන සුදුසුකමක්<br>හෝ<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීයවේදී සුදුසුකමක්<br>සහ<br>සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි උපාධියක් හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීයවේදී සුදුසුකමක්<br>සමග<br>කළමනාකරණ මට්ටමේ අඩු තරමින් වසර 10 ක පශ්චාත් යෝග්‍යතා (සුදුසුකමක් ලැබීමෙන් පසු ලබන පළපුරුද්ද.)<br><br>3. රජයේ දීප ව්‍යාප්ත සේවයේ (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ) 1 වන පංතියේ තනතුරක නිලධාරියෙකු වීම හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ තනතුරක් දැරීම.<br>සමග<br>1 වන පංතියේ තනතුරක අඩුම තරමින් වසර 05 ක පළපුරුද්ද.<br><br>වැටුප් මට්ටම<br>PS3 රු. 180,000.00 රු. 195,000.00<br><br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍ර ලේඛ අංක 01/2019 පරිදි ඉහත සඳහන් වැටුපට අමතරව, ජීවන වියදම් (COL) දීමනාවද ගෙවනු ලැබේ. |

**පොදු කොන්දේසි**

1. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.
2. සියලුම නිලධාරීන් විසින් සිය රාජකාරී අදාළ රජයේ ආයතන සහ වෙනත් නියෝජිතායතන සමග සම්බන්ධීකරණයෙන් හා සන්නිවේදනයෙන් හෝ යුක්තව ක්‍රියාකාරකම්වල නියුතු වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.
3. ශ්‍රී ලංකාව ඇතුළත විදේශීය අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.
4. ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රවීණතාව රජයේ රෙගුලාසි හා සමග හුරුපුරුදු බව සහ පරිගණක සාක්ෂරතාව, මෙම තනතුරු සඳහා අත්‍යවශ්‍ය පූර්වාවශ්‍යතාවයන් වනු ඇත.
5. රැකියා කොන්ත්‍රාත්තුව – වැඩසටහන් / ව්‍යාපෘතිවල අවශ්‍යතාව හා කාර්ය සාධනය මත පදනම්ව වාර්ෂිකව අලුත් කළ හැකි වන එක් වසරක් සඳහා වේ.
6. රජය අනුමත කළ වැටුප් පරිමාණයන් සමග දීමනා, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සහ ඉන්පසු සිදුකරනු ලැබූ යම් සංශෝධන පරිදි වනු ඇත. (http://www.treasury.gov.lk)

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**